දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650
ලේකම් / செயலாளர் / Secretary } 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 / 011-2876181
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / E - mail } info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. } PSC/EST/05-03/08/2018

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025.02.18

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 05/2023 (i)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතල සම්බන්ධයෙන් පරිපාලනමය කාර්යයන් භාර බලධරයින් නම් කිරීම</u>

අංක 2310/29 දරන හා 2022.12.14 දිනැති රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XXII පරිච්ඡේදයේ රීති අංක 294 හි XIVවැනි වගන්තිය ප්‍රකාර පහත වගුවේ (අ) තීරුවේ දක්වා ඇති සේවා සහ නිලධර ගණයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතලවලට අදාළව පරිපාලන කාර්යයන්* භාරව කටයුතු කිරීම සඳහා එහි (ආ) තීරුවේ දැක්වෙන නිලධාරීන් නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

| | සේවාවන් / නිලධර ගණයන් (අ) | පරිපාලන කාර්යයන් පවරනු ලබන බලධාරීන් (ආ) |
|---|---|---|
| I. | (අ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය<br>(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>(ඇ) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය<br>(ඈ) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය<br>(ඉ) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය<br>(ඊ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| II. | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| III. | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | පශු සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| IV. | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | මිනින්දෝරු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| V. | දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම (II)හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් සහ තෘතියික මට්ටමේ අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | තනතුර අයත් වන අමාත්‍යාංශය හෝ තනතුර අයත් වන දෙපාර්තමේන්තුව භාර අමාත්‍යාංශයේ ලේකම් |

| | | |
|---|---|---|
| VI. | දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන සහ අමාත්‍යාංශයක් යටතේ නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම (II)හි අර්ථ නිරූපනය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් සහ තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ / විශේෂ ශ්‍රේණියේ නිලධරයන්<br>උදා: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව | අදාළ ආයතන ප්‍රධානීන් |
| VII. | ඒකාබද්ධ සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන් | රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |

* ඉහත ඡේදයේ "පරිපාලන කාර්යයන්" වනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රඳවාගෙන ඇති බලතලවලට අදාළ පරිපාලන කාර්යයන් වන අතර ඊට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් වෙත පවරා ඇති බලතලවලට අදාළ කාර්යයන් ඇතුළත් නොවේ.

02. කෙසේවතුදු, පහත 03 ඡේදයේ (i) – (viii) දක්වා සඳහන් කාර්යයන් හැර අනෙකුත් සියළුම කාර්යයන් සඳහා නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීම ඉහත (අ) තීරුවේ දැක්වෙන සේවාවන් / නිලධර ගණයන් සම්බන්ධව (ආ) තීරුවේ දැක්වෙන පරිදි පරිපාලන කාර්යය භාර අදාළ ලේකම්වරයා හෝ ආයතන ප්‍රධානි විසින්ම පෞද්ගලිකව ඉදිරිපත් කළ යුතුය.

03. ඉහත (ආ) තීරුවේ දැක්වෙන අමාත්‍යාංශ ලේකම්වරයකුගේ පරිපාලන බලධාරිත්වය යටතට ගැනෙන (අ) තීරුවේ සඳහන් කුමන හෝ සේවාවකට/ නිලධර ගණයකට අදාළ පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අවශ්‍ය වන නිර්දේශයක්, නිරීක්ෂණයක් හෝ වෙනත් තොරතුරක් තමන් වෙනුවෙන් එම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා තම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු නම් කිරීමට එම සෑම ලේකම්වරයෙකුට හැකියාව ඇති අතර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

i. අදාළ සේවා ව්‍යවස්ථාවේ / බඳවා ගැනීමේ පටිපාටියේ විධි විධානවලට අනුකූලව පත්වීමෙහි ස්ථිර කිරීම
ii. අදාළ සේවා ව්‍යවස්ථාව / බඳවා ගැනීම් පටිපාටිය අනුව SL – I වැටුප් කාණ්ඩයන්හි තනතුරුවල II හා I ශ්‍රේණි උසස් කිරීම්
iii. රජයේ සේවයෙන් වෙනත් තනතුරකට හෝ පරිබාහිර තනතුරක් සඳහා මුදාහැරීම හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් සඳහා මුදා හැරීම
iv. වැඩබැලීම් / රාජකාරි ඉටුකිරීම සඳහා පත්කිරීම
v. කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා සහන ලබාදීම
vi. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 යටතේ විශ්‍රාම ගැන්වීම
vii. බලය අභිනියෝජිත බලධරයෙකු විසින් කරන ලද තීරණයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම
viii. සේවයෙන් ඉල්ලා අස්වීම

04. තවද, අතිරේක ලේකම් තනතුරෙහි එක් නිලධරයෙකුගේ සේවය අවසන්ව වෙනත් නිලධරයකු එම තනතුරට පත් කරනු ලබන අවස්ථාවක නව අතිරේක ලේකම්වරයාට ඉහත පරිදි පරිපාලන කාර්යයන් පැවරීමට සැලකිය යුතු කාලයක් ගතවන අවස්ථා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

05. මේ හේතුවෙන්, රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණ කාර්යයන්ගේ සිදුවන අනවශ්‍ය ප්‍රමාදයන් මග හරවා ගැනීම සඳහා, මින් ඉදිරියට ඔබ අමාත්‍යාංශයට නව අතිරේක ලේකම්වරයකු පත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබන සෑම අවස්ථාවකදීම ,එම අතිරේක ලේකම් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්ම කරනු ලබන කාර්යයන්ට අදාළව පරිපාලන කාර්යයන් පැවරීමට ඔබ අදහස් කරන්නේ නම්, ඒ සඳහා වූ නිර්දේශයද ඒ සමඟම ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව